தொலைபேசி) 2692491
Telephone) 2698507

ෆැක්ස்) 2692913
பெக்ஸ்) 2694860
Fax)

විද්‍යුත් තැපෑල)
மின்னஞ்சல் முகவரி) postmaster@health.gov.lk
e-mail)

වෙබ් අඩවිය)
இணையத்தளம்) www.health.gov.lk
website)

යුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health

අපේ අංකය) PA/ECH/FCAU/05/09
எமது இல) PA/ECH/FCAU/05/09
My No)

ඔබේ අංකය)
உமது இல)
Your No)

දිනය)
திகதி) 2011 05. 06
Date)

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
සියළුම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
අධ්‍යක්ෂ/ජාතික සෞඛ්‍ය විද්‍යායතනය,
සියළුම මහනගරසභා ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරුන් වෙත,

විධාන අංක: 2011/07

<u>පළතුරු ඉදවීම සඳහා රසායනික ද්‍රව්‍ය භාවිතා කිරීම.</u>

පළතුරු ඉදවීම පිණිස රසායනික ද්‍රව්‍ය අනුමත මාර්ගෝපදේශ හා අනුමත ක්‍රියාපිළිවෙලකින් තොරව යොදන බවට විවිධ අංශ වලින් ලැබෙන තොරතුරු පිළිබඳව ආහාර උපදේශක කමිටුවේදී සාකච්ඡාවට භාජනයවූ බැවින් ඒ පිළිබඳ විද්‍යාත්මක තොරතුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආහාර පරීක්ෂණාගාරික ඒකකය මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශය ලබාගන්නා ලදී.

ඒ අනුව පළතුරු ඉදවීම පිණිස දැනට භාවිතා කරනු (Ethral) එතරල් භාවිතය පිළිබඳව 1980 අංක 26 දරන ආහාර පනත යටතේ පත්කර ඇති සියළුම බලයලත් නිලධාරීන් දැනුවත්කිරීමට ආහාර උපදේශක කමිටුව තීරණය කරන ලදී.

ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ

<u>පළතුරු ඉදවීම පිණිස එතරල් භාවිතා කිරීම :</u>

1. මෙම රසායනිකය කොසෙල් ගෙඩි, ගස්ලබු, අලිඇට්පේර, අඹ ඉදවීමට පමණක් භාවිතාකල යුතුය.
2. මෙම රසායනිකය අන්නාසි, දොඩම්, ලයිම්, මිදිවැල් හා මැන්ගුස් සඳහා භාවිතා නොකළ යුතුය.
3. හොඳින් පැසුණු (මෝරන ලද) පළතුරු පමණක් මේ සඳහා භාවිතාකල යුතුය. නොමේරූ පළතුරු යොදාගැනීම සුදුසු නැත.
4. පළතුරු වලට ස්ප්‍රේ කිරීම හෝ එතරල් ද්‍රාවණයේ ගිල්වීම නොකළ යුතුය. (සෘජුව ස්පර්ශ නොකල යුතුය)
5. සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් හෝ කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ්වලට එයතැකරන ලද එතරල් (මි.ලී.1/ජලය ලී.1) ද්‍රාවනය මඟින් නිදහස්වන එතිලීන් වායුව මෙම කෘතිම ඉදවීම සිදුවේ.
6. පළතුරු ඉදවීමට අපේක්ෂිත කුටිය තුළ ඇති වාතවිධාශයෙන් 20% පමණස්ව තිබිය යුතු අතර ඒ අවකාශය තුලට සකස්කරගත් එතරල් ද්‍රාවණය (සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් හෝ කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණය) තැන්පත්කර වායුරෝධක ආකාරයට වසා පැය 24 කින් පසු විවෘත කර පළතුරු එම කුටිය තුළින් එළියට ගත යුතුය. එම පළතුරු ගෙඩියේ ලෙල්ල ඉදුනු පළතුරක් ලෙස දිස්වුවිනු පසු පරිභෝජනය කිරීම සුදුසුය.
7. පළතුරු කෘත්‍රිම ඉදවීම සඳහා භාවිතාකරන ලුණු වී පරිමාව (ගණ අතී) යන අයියකාව භාවිත එතරල් මිලි ලී. 1/ජලය ලී.1 ද්‍රාවණයෙන් මිලි.ලී. 3-5 අතර ප්‍රමාණයක් වී පරිදි ගණනය කර එම කුටිය තුල තැන්පත් කළ යුතුය.

කරුණාකර මෙම තොරතුරු ඔබ ප්‍රදේශය තුල සිටින බලයලත් නිලධාරීන්ට දැනුම්දීම සඳහා සුදුසු කටයුතු යොදන ලෙස කාරුණිකව ඉල්ලමි.

මෙම කරුණු පිළිබඳ පළතුරු කර්මාන්තයේ/වෙළඳාමේ නියැලුවන් දැනුවත්කිරීමට අවශ්‍ය කටයුතු යොදන ලෙසද තවදුරටත් දන්වා සිටිමි.

ආචාර්ය යූ.වී.මෙතිවිල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
(ප්‍රධාන ආහාර බලධාරියා)